**ශීර්ෂය 102 - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශනය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150, හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය - 102 මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වු කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 24 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.12 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය. විධිවිධානවලට අනුකූලව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශගත කර පහත සඳහන් සටහනේ දක්වා ඇත. කෙසේ වුවද, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් ගණන් දීමේ නිලධාරී ලෙස පිළියෙල කර ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉහත සඳහන් විසර්ජන ගිණුමට හෝ සැසඳුම් ප්‍රකාශනවලට පරිබාහිර මූල්‍ය ප්‍රකාශනයන් හෙයින් එම ජනරජයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාවෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් කර නොමැත.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127(1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරීම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම. | 2.3.1 |
| | (දෙපාර්තමේන්තු කටයුතු සිදුකළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තු වන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 2. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම. | 2.7 (අ) |
| | | 3. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.10 |
| | | 4. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීම | 2.9 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අවිධිමත් ගනුදෙනු | 2.6 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.12 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්. | 2.2 |
| | | 2. විදේශාධාර ව්‍යාපෘති නියමිත දිනයට ආරම්භ නොකිරීම. | 2.2 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු. | 2.3.2 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවැතීම.<br>2. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්. | 2.4 (ආ) (i)<br>2.4 (ආ) (ii) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | අයවැය ප්‍රතිපාදන රහිතව බැදීම්වලට එළඹීම. | 2.5 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම.<br>2. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.7 (ආ) (i)<br>2.7 (ආ) (ii) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සදහන් අඩුපාඩු. | 2.8 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------------

### 2.1 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයන්

-------------------------------------

(අ). මූල්‍ය හා බදු ගණනය විෂයට සම්බන්ධ දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍යසංස්ථා යටතට ගැනෙන එකී විෂයන්හී ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම අධීක්ෂණය සහ ඇගයීම.

(ආ). සාර්ව මූල්‍ය කළමනාකරණය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.

(ඇ). මූල්‍ය සම්පත් කළමනාකරණය සහ වාර්ෂික අයවැය පිළියෙල කිරීම.

(ඈ). අයවැය පිළිබඳ මූල්‍ය පාලනය බලාත්මක කිරීම සහ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම.

(ඉ). රජයේ ආදායම් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ජාතික බදු ප්‍රතිපත්ති කළමනාකරණය කිරීම.

(ඊ). රජයේ මූල්‍ය රෙගුලාසි බලාත්මක කිරීම.

(උ). ඒකාබද්ධ අරමුදල කළමනාකරණය.

(ඌ). බදු ඒජන්සි ආයතනවල සමස්ථ අධීක්ෂණය.
(එ). රාජ්‍ය වියදම් කළමනාකරණය.
(ඒ). රජයේ ප්‍රසම්පාදන උපදේශනාත්මක සේවා.
(ඔ). දෙපාර්තමේන්තු අනෙකුත් සියලුම විෂයයන්ට සම්බන්ධ කරුණු.
(ඕ). ආයතන අධීක්ෂණය සහ අනෙකුත් රාජ්‍ය මුදල් පාලනය කිරීම.
(ක). රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා මත පදනම් වූ භාණ්ඩාගාර රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම.
(ජ). දෙපාර්තමේන්තුවල කළමනාකරණ විගණනය උසස් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.
(ග). සේවක සංඛ්‍යා පාලනය.

## 2.2 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශීය ආධාර ව්‍යාපෘති

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ විදේශ ණය මුදල් යොදවා ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති 03 ක් සඳහා 2017 වර්ෂයේදී එකතුව රු. මිලියන 3,375.47 ක ප්‍රතිපාදන සලසා තිබුණද, මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හා ඉතිරි ව්‍යාපෘති 02 හි කාර්යයන් මන්දගාමී වීම නිසා එකතුව රු. මිලියන 1,896.72 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේනතුවේ හා පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් පහත සඳහන් වැය විෂයයන්ට අදාළව සලසා ගෙන තිබුණු ප්‍රතිපාදන වියදම් කිරීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුව තිබුණි. අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතුවූ රු.මිලියන 469.79 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 305.41 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂයය | වැය විෂය විස්තර | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| | **සැපයීම** | | | |
| 1201 | - ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 18.20 | 17.67 | 0.53 |
| 1203 | - ආහාරපාන හා නිල ඇඳුම් | 0.89 | 0.48 | 0.41 |
| 1204 | - වෛද්‍ය සැපයීම් | 0.9 | 0.9 | - |
| 1205 | - වෙනත් | 0.09 | 0.08 | 0.01 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2101 | - වාහන | 120 | 78.63 | 41.37 |
| 2102 | - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 119.09 | 42.05 | 77.04 |
| 2103 | - යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 60.62 | 51.68 | 8.94 |
| 2104 | - ගොඩනැගිලි ඉදිකිරීම | 150 | 113.91 | 36.08 |
| | එකතුව | 469.79 | 305.41 | 164.38 |

## 2.3.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

---------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ). ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා (ආ) ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කලයුතු වුවද අමාත්‍යාංශය එසේ සිදුකර නොතිබුණි.

(ආ). ප්‍රසම්පාදන සැලැස්ම තුල ඇතුලත් කර නොතිබුණු එකතුව රු. මිලියන 62.09 ක් වූ ප්‍රසම්පාදන කාර්යයන් 04 ක් සිදුකර තිබුණි.

## 2.3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------

(අ). පිරිසිදු කිරීමේ සේවාව සපයා ගැනීම

-----------------------------------------

මහා භාණ්ඩාගාරයේ පැරණි ගොඩනැගිල්ලේ හා නව ගොඩනැගිල්ලේ පිරිසිඳු කිරීමේ සේවාව සඳහා වාර්ෂික ගාස්තුව ලෙස එකතු කළ අගය මත බදු (VAT) රහිතව රු. 18,586,200 ක් වූ මිළකට පිරිසිදු කිරීමේ ආයතනයක් තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළයුතු බව හා එම මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 පරිදි එම මුළු පිරිවැය ඇස්තමේන්තුව, අදාළ අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය යුතු බව දක්වා තිබුණද, එපරිදි පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමක් කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 (ඇ) හි අරමුණු ඉටුවන පරිදි සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම පිණිස සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් ජාතික තරඟකාරී ලංසු පිළිබඳ ක්‍රමවේදය අනුගමනය කළ යුතු වුවද, එසේ සිදු නොකොට සීමිත මිල ගණන් යටතේ මිල කැඳවා ආයතන 03 කින් පමණක් ඉදිරිපත් කරනු ලැබූ මිල ගණන් පදනම් කරගෙන පිරිසිදු කිරීමේ සේවා ආයතනයක් තෝරාගෙන තිබුණි. විශේෂයෙන්ම පිරිසිදු කිරීමේ සේවා සැපයීමේදී මෙම ක්‍රමය අසාර්ථක වූ අවස්ථා අත්දැක තිබෙන හෙයින් මාර්ගෝපදේශ අංක 3.4 විධිවිධාන අනුව සේවා ආයතනයක් තෝරාගන්නා ලද බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(iii) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද, ලංසු පත්‍රිකාවේ ඇතුළත් 07 ඡේදයේ උපදෙස්වලට පටහැනිව ටෙන්ඩර් ප්‍රදාන ලිපිය ලබා දී දින 07 ක් හා සේවා සැපයීම ආරම්භ කර දින 11 ක් ප්‍රමාද වී, රු. 929,310 ක් වටිනා කාර්යසාධන ඇපකරය අමාත්‍යාංශය විසින් ලබාගෙන තිබුණි.

(iv) පිරිසිදු කිරීමේ සේවා සපයන ලද ආයතනයේ කොන්ත්‍රාත් කාලය අවසන්ව තිබියදී හා මහා භාණ්ඩාගාර පරිශ්‍රයේ පිරිසිඳු කිරීමේ සේවාව අසතුටුදායක තත්ත්වයේ පවතින බව සේවාදායක ආයතනය වෙත දන්වා තිබියදී, කල්වේලා ඇතිව නව ආයතනයක් තෝරා ගැනීමට පියවර නොගෙන ප්‍රසම්පාදන කමිටුව විසින් අවස්ථා 03 කදී 2017 මැයි 01 දින සිට 2017 අගෝස්තු 31 දක්වා මාස 04 ක කාලයක් සඳහා පැවති කොන්ත්‍රාත්තුවේ දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. මහා භාණ්ඩාගාර පැරණි ගොඩනැගිල්ලේ හා නව

ගොඩනැගිල්ලේ පිරිසිදු කිරීමේ කටයුතු එකම ආයතනයකට ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබූ හෙයින් එම ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කාලය ගතවන නිසා පෙර ගිවිසගත් සේවා කාලය දීර්ඝ කිරීමට කටුයුතු කල බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(ආ). විද්‍යුත් ප්‍රවේශ පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම
-------------------------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් අමාත්‍යාංශයේ ආලින්ද ප්‍රදේශය සඳහා විද්‍යුත් ප්‍රවේශ පාලන පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ලංසු කැඳවීමේදී පළමු පුවත් දැන්වීම අවලංගු කිරීම, දෙවන පුවත් දැන්වීමක් පලකිරීම හා පසුව එය සංශෝධනය කිරීමට සිදුවීම නිසා අවස්ථා 03 කදී එකතුව රු. 433,400 ක් අමාත්‍යාංශය අනාර්ථික ලෙස වැයකර තිබුණි.

(ii) මෙම කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි 23 දින ආරම්භ කර දින 60 ක් ඇතුළත එනම් 2017 මාර්තු 24 දින වන විට අවසන් කල යුතු වුවද, ඒ සඳහා මාස 11 ක කාලයක් ගතවී තිබුණි.

(ඇ). වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම
-----------------------------------
මුදල් අමාත්‍යාංශයේ 2016 වාර්ෂික වාර්තාව සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයෙන් පිටපත් 4000 ක් මුද්‍රණය කිරීම සඳහා සීමිත මිල ගණන් යටතේ මිල කැඳවා ඒවා අතරින් තෙවන අවම මිල ලෙස රු. 4,648,000 ක (එකතු කළ අගය මත බදු රහිත) ලංසුව ඉදිරිපත් කරන ලද ආයතනයෙන් මෙම මුද්‍රණ කාර්යය කරගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අවම මිල ලෙස රු. 3,934,990 ක් (එකතු කළ අගය මත බදු රහිත) හා දෙවන අවම මිල ලෙස රු. 4,433,900 ක් (එකතු කළ අගය මත බදු රහිත) ඉදිරිපත් කරනු ලැබූ ආයතන නියමිත දිනට වැඩ අවසන් කිරීම පිළිබඳ ප්‍රතිචාර දක්වා නොමැති බවට නිරීක්ෂණ දක්වා ඉහත තෙවන අවම මිල ඉදිරිපත් කරනු ලැබූ ආයතනයේ ලංසුව තාක්ෂනික ඇගයුම් කමිටුව නිර්දේශ කර තිබුණි. එය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණු අතර මෙම තෙවන අවම මිල සහිත ලංසුව හා අවම මිල සහිත ලංසුව අතර රු. 713,010 ක වෙනසක් පැවතුණි. කෙසේ වුවද තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින්, අදාළ කාර්යය නිමකර තිබුණේ දින 14 - 19 අතර පරාසයක ප්‍රමාද කාලයක් සහිතව අවස්ථා 06 කදීය.

(ii) අවම වශයෙන් රු.මිලියන 03 කට වඩා වැඩි වටිනාකම් සහිතව මීට පෙර කරන ලද මේ හා සමාන කොන්ත්‍රාත් 03 ක් පිළිබඳව අදාළ ආයතන විසින් සහතික කරන ලද ලියවිලි ඉදිරිපත් කල යුතු බව ලංසු උපදෙස් පත්‍රිකාවල දක්වා තිබුණද, තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් එම ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි.

(iii) මෙම වාර්ෂික වාර්තාව මුද්‍රණයට අදාල ප්‍රසම්පාදනයේදී 2006 භාණ්ඩ හා වැඩ සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව පහත සඳහන් විධිවිධාන අනුගමනය කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

| 2006 භාණ්ඩ හා වැඩ සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට යොමුව | විගණන නිරීක්ෂණ |
| --- | --- |
| 4.3.1. (අ) හා 4.3.2 | සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කර මුළු පිරිවැය ඇස්තතමේන්තුව අදාළ ප්‍රසම්පාදන අධිකාරිය විසින් අනුමත කිරීම සිදුකල යුතු වුවත් මෙහිදී එපරිදි කටයුතු කර නොතිබුණි. |
| 1.2 | ඡේදයේ දැක්වෙන අරමුණු ඉටුවන ලෙස අදාළ අස්ථිත්වය විසින් ප්‍රසම්පාදන කාර්යයන් සිදුකල යුතු වුවද, මෙම ප්‍රසම්පාදනයේදී මෙම වගන්තියේ අරමුණු ඉටුවන අයුරින් විවෘත තරඟකාරී ලංසු කැඳවීමක් සිදුකර නොතිබුණි. |
| අතිරේක 29 - 5.4.8 | වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තුවකදී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 කට නොඅඩු මුදලක කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය බව දක්වා තිබුණද, රු. 4,648,000 (එකතු කළ අගය මත බදු රහිත) ක්වූ මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධ කාර්යසාධන සුරක්ෂණය ලබාගෙන නොතිබුණි. |
| 8.5 (අ) | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා සම්බන්ධිත ප්‍රසම්පාදනයකදී ජයග්‍රාහී ලංසුකරු තෝරාගත් බව හා එම තීරණයට එරෙහිව යම් නියෝජනයක් තිබේනම් ඒ බව දැනුම්දීමට හැකිවන ආකාරයට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් සියළුම ලංසුකරුවන්ට ලිඛිතව දැනුම්දිය යුතු වුවද, මෙහිදී එපරිදි කටයුතු කර නොතිබුණි. |
| 8.9 (අ) | ශ්‍රී ලංකා රුපියල් 250,000 ක් ඉක්මවන වැඩ සඳහා වන කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදුකල යුතු වුවද එම සීමාව ඉක්මවූ මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව ගිවිසුම් අත්සන් කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. |

(iv) මුදල් රෙගුලාසි 237 (අ) ප්‍රකාරව ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් හෝ යටතේ කරන ලද වැඩ හෝ සැපයුම්වලදී ගිවිසුම ප්‍රකාරව සතුටුදායක ලෙස වැඩකර ඇති බවට හෝ සැපයුම්කර ඇති බවටද, නිර්දේශිත ගෙවීම් ඒවාට අනුකූල වන බවටද සහතිකයක් ඇමිණිය යුතු වුවද මෙම ප්‍රසම්පාදනයේදී එසේ සිදුකර නොතිබුණි.

(ඇ). මුදල් අමාත්‍යාංශය සඳහා විදුලි සෝපාන සවිකිරීම

මුදල් අමාත්‍යාංශයේ පවතින විදුලි සෝපාන හතර (04) ඉවත්කර නව විදුලි සෝපාන සවිකිරීම සඳහා වූ ප්‍රසම්පාදනය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 ප්‍රකාරව ප්‍රසම්පාදනයක් ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර පිළිබඳ විස්තර කර අදියර 02 ක් යටතේ ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කලයුතු වුවද මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) හා 4.3.2 ප්‍රකාරව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කර මුළු පිරිවැය ඇස්තමේන්තුව අදාළ ප්‍රසම්පාදන අධිකාරිය විසින් අනුමත කිරීම සිදුකල යුතු වුවත් මෙම ප්‍රසම්පාදනයට අදාළව එපරිදි කටයුතු කර නොතිබුණි.

(iii) මුදල් අමාත්‍යාංශය සඳහා මගී සෝපාන 04 ක් සැපයීම, ස්ථාපනය කිරීම, සහ ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා ජාතික මට්ටමේ තරඟකාරී ලංසු කැඳවීමට එකතුව රු. 111,555 ක් වැයකර පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. ඒ අනුව ලංසු ඉදිරිපත් කර තිබූ ආයතන අතරින් රු. 21,005,625 ක (එකතු කළ අගය මත බදු රහිත) හතරවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ආයතනයේ ලංසුව තෝරාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

* මෙම ප්‍රසම්පාදනය සඳහා මීට පෙර එකතුව රු. 143,190 ක පිරිවැයක් දරා ලංසු කැඳවීමට පුවත්පත් දැන්වීම් පලකර තිබුණද, ලැබුණු ලංසු ලියවිලි අසම්පූර්ණ තත්ත්වයේ පවතින බව දක්වා එම ලංසු කැඳවීම අවලංගු කර තිබුණි. අවලංගු කරන ලද ලංසු කැඳවීම සඳහා ද දෙවන ලංසු කැඳවීමෙන් තෝරාගත් ලංසුකරු විසින් රු. 20,091,600 ක (එකතු කළ අගය මත බදු රහිත) ලංසුවක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව තෝරාගත් ලංසුව , අවලංගු කරන ලද ලංසුව හා සැසඳීමේදී, රු. 914,025 ක ඉහළ වටිනාකමක් ගෙන තිබුණි. පළමු ලංසු කැඳවීමේ අවස්ථාවේදී පිළිගත් ලංසු 04 ක් ඉදිරිපත් වූ අතර ලංසු ඇගයීමේදී අවශ්‍ය සුදුසුකම් සඳහා ප්‍රමාණවත් සහතික හා ලිපි ලේඛන යනාදිය ඉදිරිපත්කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කිරීම හැර වෙනත් විකල්පයක් නොවූ බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

* දැනට පවත්නා විදුලි සෝපාන හතර ඉවත් කිරීම පිළිබඳව අවධානය යොමු නොකර නව සෝපාන සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර ඉන්පසුව පවතින පැරණි සෝපාන ඉවත් කිරීමේ කාර්යයද වසරකට අධික කාලයක් ගතවී මෙම කොන්ත්‍රාත්කරු වෙතම පවරා තිබුණි.

* පවතින සෝපාන ගලවා ඉවත්කිරීම හා එහි සිවිල් කාර්යයන් සිදුකිරීම සහ නව සෝපාන සපයා සවිකිරීම පිළිබඳ කාර්යයන් සියල්ලම ආවරණය වන පරිදි තාක්ෂණික දැනුම සහිත උපදේශක සේවා සහාය ඇතිව ලංසුලේඛන පිළියෙල කරවාගෙන හා නිශ්චිත කාලරාමුවක් හා සැලසුමක් සහිතව මෙම ප්‍රසම්පාදන කාර්යය සිදුකල යුතුව තිබුණි. එසේ සිදුනොකර වරින් වර සැලසුම් වෙනස්කිරීම් හේතුවෙන් මෙම ප්‍රසම්පාදනයේදී ගැටලුකාරී ස්වභාවයක් මතුව ඇත. ඒ හේතුවෙන් 2015 මැයි 03 දින ලංසු කැඳවීම ආරම්භ කරන ලද මෙම ප්‍රසම්පාදන කාර්යය සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 01 යි මාස 07 ක් ගතවී තිබුණද මෙම කාර්යය ආරම්භ කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

* නව සෝපාන සවිකිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත 2016 ජුනි 16 දින ප්‍රතිග්‍රහන ලිපිය ලබාදී තිබුණු අතර 2016 ඔක්තෝබර් 29 දින අදාළ කොන්ත්‍රාත්තුව සම්බන්ධව ගිවිසුම්ගත වී තිබුණි. 2016 ඔක්තෝබර් 24 දින අත්තිකාරම් මුදල් ලෙස රු. 4,663,250 ක් කොන්ත්‍රාත්කරු වෙත ලබාදී සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවුරුදු 01 යි මාස 02 ක් ගත වී තිබුණද, මෙම කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමටවත් පියවර ගෙන නොතිබුණි. එසේම මෙම අත්තිකාරම් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ලබාදී තිබුණු බැංකු ඇපකරය 2017 මාර්තු 13 දින සිට කල් ඉකුත් වී තිබුණි.

*    මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව අදාළ කොන්ත්‍රාත් ගිවිසුම හා කාර්යසාධන බැංකු ඇපකරයේ වලංගු කාලය පිළිවෙලින් 2017 අගෝස්තු 31 දින හා 2018 පෙබරවාරි 26 දින ඉකුත් වී තිබුණු අතර ඒවායේ වලංගු කාලය දීර්ඝ කරගැනීම  පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ).    මුදල් අමාත්‍යාංශයේ ආපනශාලාව පවත්වාගෙන යාම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i)    ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා ආයතනයක් තෝරා ගැනීම සඳහා ජාතික පුවත්පත්වල දැන්වීම් පලකර, ඒ සඳහා අවම මිල ඉදිරිපත්කර තිබූ ආයතනය වසරක කාලයක් සඳහා ආපනශාලාව පවත්වා ගෙනයාමට තෝරා ගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විධිමත් ගිවිසුමකට දෙපාර්ශවය එළඹ නොතිබුණි.

(ii)    ආපනශාලාව සඳහා විදුලිය, වායුසමීකරණ පහසුකම් සහ අවශ්‍ය විදුලි හා අනෙකුත් උපාංග ද මුදල් අමාත්‍යාංශය විසින් සපයා තිබුණද, ආපනශාලාව පවත්වා ගෙන යනු ලබන ආයතනය විසින් ඉදිරිපත් කල යුතුව තිබුණු රු. 200,000 ක බැංකු ඇපකරය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ඊ).    මන්ත්‍රීවරුන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදීම

රජයේ සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා පත් කර ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 11 දෙනෙකු සඳහා 2016 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට 2017 පෙබරවාරි මාසය දක්වා කුලී ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් 2017 වර්ෂයේදී  අමාත්‍යාංශය විසින්  රු. 18,006,118 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i)    මෙම ප්‍රවාහන පහසුකම ලබාගැනීම සම්බන්ධයෙන්, ප්‍රවාහන සේවා සැපයුම් ආයතන සමඟ අදාළ කොන්දේසි ඇතුළත් කරමින් අමාත්‍යාංශය, විධිමත් පරිදි වූ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii)    කුලී ප්‍රවාහන සපයන ලද ආයතන දෙක අතරින් එක් ආයතනයක් විසින් 2017 මාර්තු මාසයේ සිට ජූලි මාසය දක්වා ප්‍රවාහන සේවා සැපයීම වෙනුවෙන් එම ආයතනයට ප්‍රමාද පොළී සමඟ 2017 ඔක්තෝම්බර් 12  දිනට එකතුව රු.  12,915,949 ක් අයවිය යුතුව ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දන්වා එවා තිබුණි.  එසේ වුවද, දිගුකාලීනව මෙම සේවාව සැපයීම පිළිබඳව ගිවිසුමකට එළඹීමට අදාල ආයතනය අපොහොසත් වීම හේතු කොට ගෙන මෙම සැපයුම පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීම අත්හිටුවන ලද බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(උ).    2018 අයවැය කථාව මුද්‍රණය කිරීම

අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේ අයවැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි  භාෂා තුනම ඇතුළත් වන පරිදි පිටපත් 1000 ක් මුද්‍රණය කරවා ගැනීමට රු. 25,319,205 ක් (බදු සහිත) හා අයවැය සැකෙවින් යන මැයෙන් පිටපත් 400 ක් මුද්‍රණය කරවා ගැනීම සඳහා රු. 900,864 ක් (බදු සහිත)  වශයෙන් මුළු එකතුව රු. 26,220,069 ක් (බදු සහිත) වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) හා 4.3.2 ප්‍රකාරව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කර මුළු පිරිවැය ඇස්තමේන්තුව අදාළ අධිකාරිය විසින් අනුමත කිරීම සිදුකල යුතු වුවත් මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව මිල ගණන් කැඳවීමට පෙර පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. අයවැය කථාවෙහි අඩංගු කරුණු, පිටු ප්‍රමාණය, යොදා ගන්නා කඩදාසි හා මුද්‍රිත ද්‍රව්‍ය සහ පිටපත් ප්‍රමාණය පිළිබඳව තීරණයන් ගනු ලබනුයේ බොහෝ විට අයවැය ක්‍රියාවලියේ අවසන් අවස්ථාවේදී නිසා ඇස්තමේන්තුවක් සැකසීම ප්‍රායෝගිකව දුෂ්කර කාර්යයක් බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 632 ප්‍රකාරව, 2018 වර්ෂයට අදාළ වූ අයවැය කථාව රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කරවා ගැනීමේ හැකියාව පිළිබඳ විමසීමක් සිදුකර නොතිබුණි. රජයේ මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ රජයේ මුද්‍රණාලයාධිපති වෙත බැවින් ඉතාමත් රහසිගතව සහ ඉතා කෙටි කලකින් මුද්‍රණය කරවා ගත යුතු රජයේ අයවැය කථාව රජයේ මුද්‍රණාලයාධිපති ලවා කරවා ගැනීම ප්‍රායෝගිකව ඉතාමත් අපහසු කරුණක් බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

(iii) පොත් මුද්‍රණයට අදාළ පිරිවිතර සැකසීමේදී පොත් මුද්‍රණය සඳහා ගතවන කාලය (පැය ප්‍රමාණය) පිළිබඳව අවධානය යොමු කර නොතිබුණ අතර, තෝරාගත් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබුණු කාලය පදනම් කරගත් මිල ගණන් ගෙවීම් සඳහා යොදාගෙන තිබුණි.

(iv) මුද්‍රණ කාර්යය නිම කිරීමෙන් පසු මුද්‍රණය සඳහා ගතකල කාලය පදනම්කරගෙන, කලු වර්ණය පමණක් අඩංගු ඇතුළත පිටු සංඛ්‍යාව නොසලකා ඇතුළත සියලුම පිටු වර්ණ 4 කින් යුත් පිටුවකට අදාළ මිළ ගණන් පදනම් කරගෙන ගෙවීම් කර තිබුණි. ඒ අනුව ඇතුළත පිටු මුද්‍රණය සඳහා එකතුව රු. 20,880,000 ක් ඇතුළත් වන පරිදි පොත් 1000 ක් මුද්‍රණය සඳහා අනෙකුත් වියදම් ඇතුළුව මුළු එකතුව රු. 25,319,205 ක් අමාත්‍යාංශය විසින් ගෙවීම් කර තිබුණි. එම මුදල මුද්‍රණය කරන ලද පිටපත් සංඛ්‍යාව හා සැලකීමේදී එක් පිටපතක් සඳහා රු. 25,319 ක්වූ ඉතා ඉහළ පිරිවැයක් දරා තිබුණු බව නිරීක්ෂණය විය. 2016 වර්ෂයේ පිටපතක් සඳහා වූ රු. 4,691 ක පිරිවැය හා සැසඳීමේදී 2017 හා 2018 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 18,083 ක් හා රු. 20,628 ක් වශයෙන් පිටපතක පිරිවැයෙහි වැඩිවීමක් සිදු වී තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

(අ). වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු නොකිරීම

විසර්ජන ගිණුමේ සටහන (i) - ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ 2017 දෙසැම්බර් 31 දිනට වාහන වටිනාකම ලෙස දක්වා තිබූ රු. 189,949,957 කට අදාළව අංක PFD/RED/03/03/60 හා 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාහන සමීක්ෂණයක් සිදුකර එම වාහනවල භෞතික පැවැත්ම තහවුරු කරගැනීම පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි.

(ආ). වාහන උපයෝජනය

----------------------

(i). නිෂ්ක්‍රීය වාහන

------------------

වෙනත් අමාත්‍යාංශ විසින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත භාරදෙන ලද ධාවන තත්ත්වයේ නොමැති වාහන 05 ක් , 2018 ජූලි 31 දින වන විට මාස 07 සිට මාස 12 ක කාල පරාසයක් තුළ අමාත්‍යාංශ පරිශ්‍රයේ ආවරණයක් නොමැතිව අනාරක්ෂිතව ගාල් කර තිබුණු අතර එම වාහන සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. මේ වන විට මෙම රථයන් අපහරණය කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති අතර වාහන තක්සේරු කිරීමේ කමිටුව මගින් වාහන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනය වෙත දන්වා එවා තිබුණි.

(ii). බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

---------------------------------------------

අමාත්‍යාංශයට අයත් වාහන 13 ක්, විධිමත්ව පවරාදීමකින් තොරව අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 08 ක්වෙත ලබා දී තිබුණු අතර මෙම වාහන අතරින් වාහන 02 කට අදාල නඩත්තු වියදම් සඳහා 2017 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් එකතුව රු. 155,957 ක් වැයකර තිබුණි.

**2.5 බැදීම් හා බැරකම්**

**--------------------**

**වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැඳීම්වල ට එළඹීම**

**------------------------------------------------------------**

මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රසම්පාදන ඉතිරිවීම් ඉක්මවා බැදීම්වලට එළඹීමට නොහැකි වුවද වැය විෂයයන් 12 ක් සඳහා ඉතිරිය ඉක්මවා එකතුව රු. මිලියන 100.69 ක බැදීම් ඇතිකර ගෙන තිබුණි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

**--------------------**

2017 වර්ෂයේදී අමාත්‍යවරුන්/ පාර්ලිමේන්තු මන්ත්‍රීන් විසින් විවිධ දේශීය උත්සව හා රැස්වීම් සඳහා සහභාගී වීමට යොදාගත් අභ්‍යන්තර ගුවන් සේවා සඳහා ගාස්තු ලෙස රු. 3,500,130 ක් වැයකර තිබුණි. මහජන නියෝජිතයන්ට දේශීය ගමන් සඳහා ගුවන් සේවා යොදා ගැනීම පිළිබඳව නිකුත් කරන ලද චක්‍රලේඛ හෝ උපදෙස් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවුනි. ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ කාර්යභාරය හා සැලකීමේදී දුර ගමන් සඳහා දිගු කාල වේලාවක් ගතවන මහා මාර්ග හරහා ගමන් කිරීම ප්‍රායෝගිකව දුෂ්කර කරුණකි. මෙම සංචාරයන් ඉතා හදිසි හා ඉතා අත්‍යවශ්‍ය වීමත්, ගරු අමාත්‍යතුමා හා අනෙකුත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ හදිසි රාජකාරීමය තත්ත්වයන් සලකා ඉතා ඉක්මණින් කොළඹට පැමිණීම අත්‍යාවශ්‍ය බැවින්ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් උප සමාගමක් වන Helitours (pvt) Ltd වෙතින් මෙම සංචාරයන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට ක්‍රියාකර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විගණනයට දන්වා එවා තිබුණි

## 2.7 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 766.28 | 763.42 | 2.83 | 0.37 |
| | මූලධන | 1,854.17 | 617.84 | 1,236.33 | 67 |
| | **එකතුව** | **2,620.45** | **1,381.26** | **1,239.19** | **47** |
| 2014 | පුනරාවර්තන | 2,699.93 | 2,699.69 | 0.24 | - |
| | මූලධන | 3,004.37 | 1,795.54 | 1,208.83 | 40 |
| | **එකතුව** | **5,704.30** | **4,495.23** | **1,209.07** | **21** |
| 2015 | පුනරාවර්තන | 573.13 | 571.16 | 1.97 | 0.34 |
| | මූලධන | 3,056.98 | 701.95 | 2,355.02 | 77 |
| | **එකතුව** | **3,630.11** | **1,273.11** | **2,356.99** | **65** |
| 2016 | පුනරාවර්තන | 1,068.81 | 964.34 | 104.47 | 10 |
| | මූලධන | 2,483.89 | 2,209.41 | 274.48 | 11 |
| | **එකතුව** | **3,552.70** | **3,173.75** | **378.95** | **11** |
| 2017 | පුනරාවර්තන | 1,070.63 | 1,017.08 | 53.55 | 05 |
| | මූලධන | 4,559.29 | 2,205.81 | 2,353.48 | 52 |
| | **එකතුව** | **5,629.92** | **3,222.89** | **2,407.03** | **43** |

මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ). අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම

අමාත්‍යාංශයට අදාල කාර්යභාර්යන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුව තාත්වික ලෙස පිළියෙල කර නොතිබීම නිසා පහත සඳහන් ඌණතාවයන් සිදු වී තිබුණි.

#### (i). අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීම

වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වැය විෂයයන් 47 ක් සඳහා රු. 310,156,400 ක් ද, මූලධන වැය විෂයයන් 06 ක් සඳහා රු. 147,705,500 ක් ද, මුල් ප්‍රතිපාදන සලසා නොතිබූ, පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා රු. 1,030,970 ක් හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා රු. 120,607,100 ක් වශයෙන් මුළු එකතුව රු. 579,499,970 ක අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. මෙය එම වැය විෂයයන් සඳහා මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 108 ක් විය. අනපේක්ෂිතව ඇති වූ වෙනස්කම් හේතුවෙන් යම් යම් වැය විෂයන් වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදනයන් ලබා ගැනීමට හා වීරමොං පටිපාටිය යටතේ ප්‍රතිපාදන සලසා ගැනීමට සිදුවූ බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනය වෙත දන්වා එවා තිබුණි.

(ii). අයවැය යෝජනා ක්‍රියාත්මක නොකිරීම

----------------------------------------------

2017 වර්ෂයේ අයවැය යෝජනා 276 යටතේ, අගතියට පත් මූල්‍ය සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මූල්‍ය වත්කම් කළමනාකරණ ඒජන්සියක් පිහිටුවීමට ආරම්භක ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස රුපියල් 10,000,000 ක් වෙන් කිරීමටද, වසර 7 කින් කල්පිරෙන රුපියල් 10,000,000,000 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කරයක් නිකුත් කිරීමට ද යෝජනා වී තිබුණි. එසේ වුවද මේ සඳහා මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන නොතිබූ හෙයින් වැය විෂයය අංක 102–1-2–15–2509 - වෙනත් මූලධන වියදම් යටතේ රු. 10,010,000,000 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, එම යෝජනාව ක්‍රියාත්මක නොකර එලෙස සලසාගත් ප්‍රතිපාදනය 2017 සැප්තැම්බර් මාසයේදී අවලංගු කර තිබුණි. අගතියට පත් මූල්‍ය සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මූල්‍ය වත්කම් කළමනාකරණ ඒජන්සියක් පිහිටුවීමට මූලික කටයුතු සකස් කල ද, මෙවැනි ආයතනයක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව නැවත සලකා බැලීමෙන් අනතුරුව එහි කටයුතු අවසන් කිරීම හේතුවෙන් ප්‍රතිපාදන අවලංගු කරන ලද බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනය වෙත දන්වා එවා තිබුණි.

(ආ) විසර්ජන ගිණුම

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

-------------------------------------------------------

වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 9.55 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ii). අධි ප්‍රතිපාදන සලසා තිබීම

-------------------------------

වැය විෂයයන් 09 ක් සඳහා සලසාගෙන තිබුණු එකතුව රු. මිලියන 2,605.22 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 921.38 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 28 සිට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමාද කිරීමත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු නැවත සිදු කිරීමට සිදු වීමත්, පූජ්‍ය පක්ෂය සඳහා වාහන මිලදී ගැනීම තාවකාලිකව නැවැත්වීමට සිදුවීමත්, SRIS දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසන් කිරීමට නොහැකි වීමත්, මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය 2017 වර්ෂය තුළ ආරම්භ කිරීමට නොහැකි වීමත්, ආදි කරුණු හේතුවෙන් මෙම ප්‍රතිපාදනයන්ගේ ඉතිරිවීම් මත මෙම අධි ප්‍රතිපාදන තත්වය ඇති වී ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනය වෙත දන්වා එවා තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**---------------------------------------------**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 10201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 19 | 18.61 | 10 | 12.41 | 70 | 52.86 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 901,667 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 03 ක සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණු අතර එම ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය විවිධ ප්‍රයත්න දැරුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.9 අග්‍රිම ගිණුම

2017 වර්ෂයේ භාණ්ඩාගාර අග්‍රිම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| මාසය | සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය | ලැබී තිබුණු අග්‍රිමය | සැලසුම් කළ හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර වෙනස | ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු. මිලියන |
| ජනවාරි | 474.14 | 474.14 | 134.54 | - | (339.59) |
| පෙබරවාරි | 114.17 | 114.17 | 172.10 | - | 57.93 |
| මාර්තු | 286.75 | 286.75 | 113.35 | - | (173.40) |
| අප්‍රේල් | 401.37 | 401.37 | 282.00 | - | (119.37) |
| මැයි | 593.85 | 593.85 | 72.50 | - | (521.35) |
| ජුනි | 394.26 | 394.26 | 193.50 | - | (200.76) |
| ජූලි | 346.94 | 346.94 | 128.00 | - | (218.94) |
| අගෝස්තු | 383.54 | 383.54 | 145.52 | - | (238.02) |
| සැප්තැම්බර් | 306.04 | 306.04 | 61.00 | - | (245.04) |
| ඔක්තෝබර් | 283.97 | 283.97 | 129.07 | - | (154.90) |
| නොවැම්බර් | 324.37 | 324.37 | 114.00 | - | (210.37) |
| දෙසැම්බර් | 610.72 | 610.72 | 120.00 | - | (490.72) |
| **එකතුව** | **4,520.12** | **4,520.12** | **1,665.58** | | **(2,854.54)** |

ඉහත තොරතුරු අනුව සැලසුම් කල පරිදි අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා 2017 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් එකතුව රු. මිලියන 4,520.12 ක් අග්‍රිම වශයෙන් ඉල්ලුම්කර තිබුණද, භාණ්ඩාගාරය විසින් එකතුව රු.මිලියන 1,665.58 ක් පමණක් ලබාදීම නිසා එකතුව රු.මිලියන 2,854.54 ක් ඉල්ලුම් කල අග්‍රිමයට වඩා අඩුවෙන් ලැබී තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.10 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ සඳහන් 2017 දෙසැම්බර් 31 දිනට පෙන්නුම් කරන ශේෂයන් ස්ථාවර වත්කම් ලේඛනයේ අගයන් සමඟ සැසඳෙන බවට සහතික කර තිබුණද විධිමත් පරිදි යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර ජංගම නොවන වත්කම් සංචලනයන් පිළිබඳ උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ). 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. මෙම චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම ප්‍රායෝගිකව විවිධ ගැටළු හා අපහසුතා පැන නගින හෙයින් ඒ පිළිබඳව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

## 2.11 තිරසර අරමුණු ළඟා කර ගැනීම

වසර 2015 සැප්තැම්බර් මස එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සාමාජික රටවල් පලකළ එකඟතාවය ප්‍රකාරව වසර 2030 වන විට සෑම සාමාජික රටක් විසින්ම ළඟා කරගත යුතු අරමුණු සහ ඉලක්ක ඇතුළත් තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය එළි දක්වා ඇත. මෙම න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව අමාත්‍යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක වියයුතුද යන්න පිළිබඳව දැනුවත්ව අදාළ සුදුසු ඉදිරි පියවර ගෙන තිබූ බව විගණනයේදී අනාවරණය නොවීය. මෙම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක වෙත ළඟා වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව අභ්‍යන්තර චක්‍රලේඛ මගින් ද , 2018 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ මගින් ද දැනුවත් කල අතර ඒ අනුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

## 2.12 මානව සම්පත් කළමනාකරණය

### 2.12.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 303.46 ක් වැය කර තිබුණි. ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල වියදම රු. 847,654 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 33 | 13 | - |
| (ii) | තෘතීය මට්ටම | 08 | 05 | 03 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 138 | 122 | 16 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 154 | 156 | | 2 |
| (v) | අනියම්/ කොන්ත්‍රාත් | 52 | 42 | 10 | - |
| | | 398 | 358 | 42 | 2 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 42 ක් එනම් අනුමත සංඛ්‍යාවෙන් සියයට 11 ක් පුරප්පාඩු පැවත තිබුණි. මෙම පුරප්පාඩු මේ වන විට සම්පූර්ණ කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

**(ආ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ තත්‍ය සේවක සංඛ්‍යාව 358 ක් වූ අතර එයින් නිලධාරීන් 195 දෙනෙකු හට කිසිම ආකාරයේ පුහුණුවක් සමාලෝචිත වර්ෂයේදී ලබා දී නොතිබුණි. එය තත්‍ය සේවක සංඛ්‍යාවෙන් සියයට 54 ක් විය.